# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## කණිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ **කණිෂ්ඨ කලමනාකාර - තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර** සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **කණිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ නිලධාරී - තනතුරු (01)**

  01. *අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද*

  (i). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය/ පරිගණක විද්‍යා උපාධිය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක්

  **හෝ**

  (ii). තොරතුරු තාක්ෂණ විෂයට අදාලව තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  **හෝ**

  (iii). තොරතුරු තාක්ෂණ විෂයට අදාලව තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  **සහ**

  සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පෞද්ගලික අංශයේ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම. **හෝ**

  (iv). තොරතුරු තාක්ෂණ විෂයට අදාලව අදාල තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  **සහ**

  සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පෞද්ගලික අංශයේ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

  **(පෞද්ගලික අංශයේ සේවා පළපුරුද්ද ද මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ.)**

- වයස් සීමාව **අවුරුදු 22-45**
  (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා වයස් සීමාව අදාල නොවේ.)

- වැටුප් පරිමාණය :

  **JM 1.1**

  රු: (42,600/= - 10×755/= - 18×1,135/= – 70,580/=)

  **රු: 65,400/-** ක සියලු දීමනා සහිත මුලික වැටුප් පියවරෙහි තබන අතර, වරින් වර රජය විසින් අනුමත අනිකුත් සියලුම දීමනා ද හිමි වේ.

- පොදු කොන්දේසි

  මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර වසර 03ක පරිවාස කාලයකට යටත් ය.
  සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් 8% ක දායක මුදලක් ගෙවිය යුතු අතර, අරමුදල විසින් 16% ක් ගෙවනු ලැබේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට, අරමුදල විසින් 3% ක දායක මුදලක් ගෙවනු ලැබේ. මෙයට අමතරව වාර්ෂික ප්‍රසාද දීමනාව සහ මාසික ප්‍රවාහන දීමනාවට හිමිකම් ලබයි.
  ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත පහත සඳහන් ලිපිනයට **2024.05.22** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලේඛන වල ඡායා පිටපත් ද සමඟ පහත ලිපිනයට එවිය යුතුය. තවද **මෙම සහතික පත්වල මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කල යුතුය.**

  1. උප්පැන්න සහතිකය
  2. අධ්‍යාපන සහතික
  3. සේවා සහතික
  4. මෑතකදී ලබාගත් චරිත සහතික 02

**පාලන භාරකාර,**
**ලෝහෝර් ආර්යා ණය අරමුදල,**
**අංක: 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**
**කොළඹ - 02**